# 45

# සාංචි සහ භාර්හුත් ස්තූප ආකෘතිවල විශේෂ ලක්ෂණ

*ටී. කේ. එම්. කෞශල්‍යා සුභාෂිනී තෙන්නකෝන්* [1]
HU/2012/0756

ඉන්දියාවේ පිහිටි සාංචි මහා ස්තූපය සහ භාර්හුත් ස්තූපවල ආකෘතික ලක්ෂණ අතර ප්‍රදක්ෂිණා පථ, සෝපාන පථ, දොරටු සතර, තොරණ, ගර්භය, හර්මිකාව, යෂ්ටිය සහ ඡත්‍ර දැක්විය හැක. මෙම ස්තූප ආකෘතික ලක්ෂණවල විශේෂත්වය පිළිබඳ කරන ලද අධ්‍යයනයක් මෙම ලිපිය මඟින් ඉදිරිපත් කර ඇත. පර්යේෂණ ක්‍රමවේදය ලෙස සාහිත්‍යයික මූලාශ්‍ර, ක්ෂේත්‍ර ගවේෂණ, පුරාවිද්‍යාත්මක තොරතුරු හා පූර්ව පර්යේෂකයන් විසින් සිදුකර ඇති පර්යේෂණවල දත්ත උපයෝගී කරගනු ලැබේ. සාංචි මහා ස්තූපයේ බිම් මට්ටමේ සහ පොළවේ සිට අඩි 16 උඩින් ප්‍රදක්ෂිණා පථ (මේධි) වේ. සෝපාන යුගලයකින් ප්‍රදක්ෂිණා පථයට නැගිය හැක. භාර්හුත් චෛත්‍යයේ එක් ප්‍රදක්ෂිණා පථයකි. ස්තූප දෙකෙහිම ප්‍රදක්ෂිණා පථවලට ගල් වැටක් ඇත. බිම් මට්ටමේ ප්‍රදක්ෂිණා පථයේ (මුග්දවේදී) ගල් වැටෙහි සතර දිශාවල දොරටු සතරකි. දොරටු ඉදිකර ඇත්තේ පුද්ගලයෙකු නිරායාසයෙන්ම දක්ෂිණාවර්ථව ප්‍රදක්ෂිණා කරවීමේ අදහසිනි. දකුණුපස ගරාඩි වැට වැඩිපුර මදක් ඉදිරියට කොට ඉදිකිරීම එයට හේතුවයි. භාර්හුත් ස්තූපයේ දොරටු පිටතට නෙරා ඇති පවුරු කොටස් නිසා එම ප්‍රාකාරය ස්වස්තිකයක හැඩය ගනී. සාංචි තොරණ කැටයම්වල වස්තුවිෂය ලෙස ජාතක කතා, බුද්ධ චරිතයෙහි සිද්ධි, ඓතිහාසික ප්‍රවෘත්ති පාදක වී ඇත. තොරණේ පූර්ණ උන්නත යක්ෂණී රූප වේ. භාර්හුත් චෛත්‍ය ගල් වැට සහ ප්‍රකාරශීර්ෂ ශිලාවේ සෑම අඟලක් ම මල්වැල්, ලියවැල්, පළතුරු හා ආභරණ දක්වන සැරසිලි මෝස්තරවලින් හා බෞද්ධ කතාවස්තු නිරූපණය කර ඇත. ඒවා වෘත්තාකාර තලවල කැටයම්කර ඇත. දොරටුවල ගල් ස්ථම්භවල යක්ෂණී රූප වේ.  කුවේර සහ චන්ද්‍ර යක්ෂණිය බව ශිලා ලිපිවලින් කියවේ. ස්තූප කැටයම්වල බුදුන් සංකේතානුසාරයෙන් (ඡත්‍ර, බෝධිය, වජ්‍රාසනය, සිරිපතුල, ධර්ම චක්‍රය) දක්වා ඇත. ස්තූප දෙකෙහිම ගර්භ අර්ධ ගෝලාකාර වේ. ඇතුළත අමු ගඩොලින් හා පිටත පිළිස්සූ ගඩොලින් ඉදි කර පසුව ඝන බදාමයකින් ගර්භය වසා තිබේ. හර්මිකාව ගර්භය මුදුනේ අඩි 10x10' ප්‍රමාණයේ ගල් වැටකි. මෙහි කැටයම් නැත. උස අඩු ය. හර්මිකාව මධ්‍යයේ මුදුන උල් අටපට්ටම් හැඩ ශෛලමය යෂ්ටියකි (යූපස්ථම්භය). යෂ්ටියෙහි වෘත්තාකාර පැතලි ශෛලමය ඡත්‍ර 3ක් පහළ සිට ඉහළට කුඩා වන අයුරින් නිමවා ඇත. ත්‍රී රත්නය ඉන් හැඟවෙන බව පවසයි. ප්‍රදක්ෂිණා පථ අවහිරයකින් තොරව ආරක්ෂා සහිතව ගමන් කිරීමට හැකි ලෙස ඉදි කිරීම, තොරණ සහ ගල් වැටෙහි බෞද්ධ වස්තු විෂය රැගත් කැටයම් නිර්මාණයෙන්, බෞද්ධාගම පිළිබඳ සාමාන්‍ය ජනයාට ඉගෙනීමට අවස්ථාව සැළසීම, බුදුන් වෙනුවට සංකේත යොදා ගැනීම සුවිශේෂ ලක්ෂණ ලෙස නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පදඃ ස්තූප, ආකෘතික ලක්ෂණ, වස්තු විෂය, බෞද්ධ කතා වස්තු

---

*1 දෘශ්‍යකලා හා සැලසුම්කරණය (විශේෂවේදී) දෙවන වසර*